# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

# இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

## වෙළඳ අමාත්‍යාංශය

## තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) අංශයේ අධිතාක්ෂණ අපනයන වැඩිකරලීම පිණිස නවෝත්පාදක නිෂ්පාදන/ නව්‍ය මෘදුකාංග නිර්මාණ දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් / තාක්ෂණ ඇරඹුම් සඳහා මූල්‍යාධාර

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) තුළ අධිතාක්ෂණ අපනයන වර්ධනය කරලීමට නවෝත්පාදන නිපැයුම් ICT පාදක මෘදුකාංග නිර්මාණය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (ICT SMEs) / තාක්ෂණ ඇරඹුම් සමාගම් (ICT Start-up) වෙත 2022 අයවැය යෝජනා යටතේ මූල්‍ය ආධාර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික සහය ජාතික විද්‍යා පදනම (NSF) මගින් ලබා දෙනු ලැබේ.

**ප්‍රතිලාභීන්**

අපනයන ඉලක්ක කළ නවොත්පාදක නිපැයුම් / නව්‍ය මෘදුකාංග නිර්මාණ සහිත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ තාක්ෂණ නව ඇරඹුම් සමාගම් (ICT Start-up).

**ආධාර ලබා දිය හැකි ක්ෂේත්‍ර**

- ICT අංශය තුල අධි තාක්ෂණ අපනයන වර්ධනය කරලීමට නවොත්පාදක නිපැයුම් / නව්‍ය මෘදුකාංග නිර්මාණ සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් / නව තාක්ෂණ ඇරඹුම් සමාගම් දිරිගැන්වීම.
- IOT, AI, AR/VR වැනි නව්‍ය තාක්ෂණ අංශයන් ඔස්සේ නවෝත්පාදන සිදු කරන සමාගම් සඳහා පේටන්ට් බලපත්‍ර (IP/PCT) ලියාපදිංචි කිරීමට සහය දීම.
- විදේශ වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ දේශීය ICT සන්නාමයන් ස්ථාපිත කිරීම.
- ගෝලීය අගය දාමය සමග සම්බන්ධතා ස්ථාපිත කිරීම.

**ආධාර ලබාගැනීමට අවශ්‍ය සුදුසුකම්**

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (SME) / නව ඇරඹුම් සමාගම් (Start-up) විය යුතු ය. (වෙබ් අඩවිය පරිශීලනය කරන්න).
- 100% දේශීය හිමිකාරිත්වය සහිත ICT SME / ICT Start-up.
- අපනයන අභිමුඛ තොරතුරු තාක්ෂණ නව නිපැයුම් විය යුතු ය.
- තොරතුරු තාක්ෂණ නිපැයුම් / නව්‍ය මෘදුකාංග නිර්මාණ පිළිබඳ පළපුරුද්ද (අදාළ ලේඛන / සාක්ෂි ඉදිරිපත් කල යුතු ය.)
- සමාන ව්‍යාපෘති සඳහා පසුගිය වසර 03 තුළ කිසිදු රාජ්‍ය මූල්‍ය ආධාරයක් නො ලද ආයතන.

**තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) සහය**

එක සමාගමකට උපරිමය රුපියල් මිලියන 4.0 දක්වා වේ. ව්‍යාපෘති පිරිවැයෙන් 70% උපරිමයක් දක්වා සමාගම විසින් ආයෝජනය කළ මුදල ආපසු ගෙවීමේ පදනම මත, මූල්‍යමය ආධාර ලබා දෙනු ලැබේ. යෝජනා ක්‍රමයේ මාර්ගෝපදේශ හා අයදුම්පත (EDB) අපනයන සංවර්ධන මණ්ඩලයේ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක.

**අයදුම් කිරීම හා තෝරා ගැනීම**

අපනයන සංවර්ධන මණ්ඩලයේ www.srilankabusiness.com වෙබ් අඩවියේ "Announcements" යටතේ ලබාගත හැකි "අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI)" ආකෘති පත්‍රය සම්පූර්ණ කොට 2022 මාර්තු 04 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කළයුතු ය. අභිලාෂය ප්‍රකාශ කිරීම් (EOI) ඉදිරිපත් කොට ඇති සමාගම් සඳහා ආධාර යෝජනා ක්‍රමය පිළිබඳ විස්තර ලබා දීම සඳහා සම්මන්ත්‍රණයක් (Webinar) පැවැත්වේ. සම්මන්ත්‍රණ දිනය යථා කාලයේ දී දැනුම් දෙනු ඇත. යථා පරිදි සම්පූර්ණ කළ අයදුම්පත් අදාළ සියලු ම ලිපි ලේඛන සමග මාර්ගෝපදේශයෙහි පැහැදිලිව නියම කර ඇති පරිදි 2022 මාර්තු 11 දින හෝ ඊට පෙර ඉහත වෙබ් අඩවිය හරහා යොමු කරන්න.

වැඩි විස්තර සඳහා කරුණාකර රවින්දි රණරාජා මිය සහකාර අධ්‍යක්ෂ - විද්‍යුත් තැපැල: ravindi@edb.gov.lk සහ දිනේෂ් අත්තනායක මයා අපනයන සංවර්ධන නිලධාරී - විද්‍යුත් තැපැල: dinesh@edb.gov.lk සහ දුරකථන අංක 0112303862 හෝ 0112300705 (233) ඔස්සේ සම්බන්ධ විය හැක.


**සභාපති හා ප්‍රධාන විධායක,**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**

**නො. 42, EDB/ NDB Tower, නවම් මාවත, කොළඹ 02.**

**වෙබ් අඩවිය : www.srilankabusiness.com**